# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය SINHALA

1969 to 2029 ECHO OF HIS CALL SINCE 1969

**India's National Spiritual Newspaper** ₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

**Editor : S. SAM SELVA RAJ** 16 Languages

Vol. XX YEAR OF OUR LORD JESUS CHRIST, 2026 JANUARY Issue No. 02


## ශුද්ධවූ බයිබලය

### (යෝවෙල් 2:21-26)

21. එම්බා දේශය, භය නොවී, ප්‍රීතිසන්තෝෂවෙන්න, මක්නිසාද ස්වාමීන්වහන්සේ මහත් දේ කළසේක.

22. වනයේ මෘගයෙනි, භය නොවව්, මක්නිසාද කාන්තාරයේ ගොදුරු-බිම්වල තෘණ අවගනියි, ගස්ද එලදෙයි, අත්තික්කා ගසද මිදි වැලද එවායේ ස්වරසය දෙති.

23. ඉතින් සියොන් පුත්‍රයෙනි, තුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ කෙරෙහි ප්‍රීතිසන්තෝෂවෙන්න. මක්නිසාද උන්වහන්සේ තුඹලාට පළමුවෙනි වර්ෂාව නිසිකරමට දුන්සේක, තද වැස්ස වන පළමුවෙනි වර්ෂාවද පළමුවෙනි මාසයේ අන්තිම වර්ෂාවද උන්වහන්සේ තුඹලා උදෙසා වස්වනවා ඇත.

24. එවිට කමත් ධාන්‍යවලින් පිරෙනවා ඇත, මිදියුසද තෙල්ද පැස්වලින් ඉතිරෙනවා ඇත.

25. මා විසින් තුඹලා අතරට එවූවාවූ මාගේ මහත් සමූදාව වන පළගැටියන්ද කෙදි-පළගැටියන්ද සපන-පළගැටියන්ද පළගැටි පණුවන්ද කාස්තිකළාවූ අවුරුදු මම තුඹලාට නැවත දෙන්නෙමි.

26. තුඹලා වනාහි කෑම කා තෘප්තියට පැමිණ, තුඹලා ගැන පුදුමලෙස ක්‍රියා කළාවූ තුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ නාමය වර්ණනාකරන්නහුය. මාගේ සෙනඟ කිසි කලෙකත් ලජ්ජාවට පත් නොවන්නෝය.

# ඔබට අහිමි වූ දේ මෙම නව වසරේදී නැවත ලබා ගත හැකියි !

*Sis. Angel*

## YOU CAN RECLAIM WHAT YOU LOST IN THIS NEW YEAR!





ඔබට ඉතා ප්‍රීතිමත් හා ආශිර්වාදමත් 2026 නව වසරක් වේවා!

අපගේ ස්වාමි වූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අනගි නාමය කරන කොට ගෙන කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ මුලස්ථානයෙහි සුබ පැතුම් හා ආශිර්වාද යෙහෙමි.

අප මෙම නව වසරට පා තබන විට් ස්වභාවික ලෙස සිදුවෙන්නාවූ දේ දෙස හැරීම බලමින් ඉදිරියේදී සිදුවන්නාවූ දේ දෙස බලා සිටිමු. සමහර වර්ෂයන් අපට සටන්කාමී කාලයන් මෙන් පෙනුනද තවත් කාලයන් ජයග්‍රහණයේ සෘතු බවට පත්වෙයි. 1 රාජාවලිය 18:1 වන පදය තුළින් අපට මතක් කරන්නේ කාලයන් සමඟ දෙවියන් වහන්සේගේ දිව්‍යමය වෙනස් වීමක් ගෙන එන බවයි. දිගු කාලයක් තුළ බලා සිටින්නාවූ ජයග්‍රහණ, අවසානයේ ප්‍රකාශ වන මොහොතයි.

3 වෙනි පිටුවට ...




**Echo of His Call**

***Christian YouTube Channel!***

Every day 2 minutes message by

**Pr. S. Sam Selva Raj!**

**in English, Hindi, Tamil & Telugu**

**and**

**Tamil & English Message & Prayer**

**Sunday 8.30 A.M. & 6.00 P.M.**

★ Please Subscribe and Share ★

# ECHO OF HIS CALL - (Marching towards 60th year)

Estd. 1969

## from your dearly beloved brother...





### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Dr. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
EX MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech, M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.org
YOUTUBE CHANNEL
Echo of His Call

".....අවුරුද්ද පටන් ගැන්මේ සිට අවුරුද්ද අන්තිමය දක්වා නුඹේ දෙවි වූ ස්වාමින්වහන්සේගේ ඇස් නිරන්තරයෙන් එය කෙරෙහි යොමු වී තිබේ

- (ද්විතීය කතාව 11:12)

ස්වාමීන් වහන්සේ තුළ ප්‍රේමණීය සහෝදර සහෝදරිය,

අපගේ ස්වාමී වූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ඔබට සුබ පතමි! ඔබටත් ඔබගේ පවුලටත් ආශිර්වාදමත් හා සපලවත් වන්නාවූ සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමු!



අප ඔබටත් ඔබගේ පවුලටත් අසිරිමත් නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමු! පසුගිය වසරේදී අප අතර සිටින බොහෝ දෙනෙක් විවිධ ප්‍රශ්න හා කරදරවලට මුහුණ දුන්නෙමු. සමහර විට දෙවියන්වහන්සේ නිහඬයි කියා සිතන්නට ඇත. නමුත් දේව වචනය අද පවසන්නේ; යෝසෙප්ව පාලු ළිඳකින් ඔසවා මාලිගාවෙහි වාසය කිරීමට ක්‍රියා කළා වූ දෙවියන් වහන්සේ යෝසෙප්ට ක්ෂණිකව ඔහුගේ වේදනාකාරී ජීවිතයේදී ඔහුට උපකාර කළේ නැත. සමහර විට අපගේ ජීවිතයද මෙසේ ස්වාමීන්වහන්සේ නියම කළ වේලාවේදී ඔබවත් ඔසවයි.

*"එබැවින් දෙවියන් වහන්සේ සුදුසු කාලයේදී නුඹලා උසස් කරන පිණිස උන්වහන්සේගේ බලවත් හස්තයට යටත් වෙයල්ලා." (1 පේතෘස් 5:6)*


මෙම නව වසර තුළදී ඔබගේ ජීවිතයේ අලුත්ම දේ සිදුවන වසරක් වේවා! දෙවියන් වහන්සේගේ ආශිර්වාද අලුත් ආකාරයෙන් අත්දකින වසරක් වේවා!

*"මක්නිසාද මා විසින් සාදන අලුත් අහසත් අලුත් පොළවත් මා ඉදිරියෙහි පවතින්නාක් මෙන් නුඹලාගේ වංශය සහ නුඹලාගේ නාමය පවතින්නේ යැයි ස්වාමීන් වහන්සේ කියන සේක." (යෙසායා 66:22)*

මෙම වසරේ අප ඉදිරියෙහි බොහෝ සේවාවන් තිබේ. මානසික ලෙස මෙය අපගේ ප්‍රඥාවෙන් කළ නොහැකි නිසා අද මා ඔබගෙන් ඉල්ලන්නේ දිගටම අපි වෙනුවෙන් යාච්ඤා කරන පිණිසයි.

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ◻ BIBLECOR - Postal Courses (3 languages) ◻ YouTube Ministry ◻ Online Courses ◻ Theological Correspondence Courses (2 languages) ◻ Church Planting ◻ Nehemiah Bible Colleges ◻ Gospel Printing Press ◻ Great Commission Partners ◻ St. Paul's Matriculation School ◻ Crusades ◻ Community Development

## මෙම වසරේදී අප කළ යුතු කාරණාවන් 3ක් මා පහත සඳහන් කරන්නෙමි;




1. ඔබේ පාලකතුමාටත් ඔබගේ සභාවටත් ප්‍රේම කරන්න. ඔබ සභාවේ පවත්වන සෑම නමස්කාර දේව මෙහෙයන් වලටම සහභාගී වී උන්වහන්සේගේ වචනය තුළ ස්ථිරව පවතින්න.
2. යාච්ඤා ජීවිතයට ප්‍රමුඛස්ථානය දෙමින් නිතරම දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයෙහි රැඳී සිටින්න.
3. දෙවියන් වහන්සේ ඔබට දී තිබෙන්නා වූ නීරෝගීකම හා ආර්ථිකමය සෑම ආශීර්වාද තුළින් උන්වහන්සේට විශ්වාසවන්තව සේවයක් කරන්න.

දෙවියන්වහන්සේගේ ආරක්ෂාව ඔබගේ ජීවිතය තුළ අත්දකින්නය කියා අප යාච්ඤා කරමු. තවද උන්වහන්සේගේ යහපත් කමත්, කරුණාවත් ඔබ සමග පවතිමින් උන්වහන්සේගේ පොරොන්දු සෑමදාම ඔබගේ ජීවිතය තුළ ඉෂ්ට වේවා! ස්වාමින්වහන්සේ ඔබට ආශීර්වාද කරන සේක! උන්වහන්සේගේ කරුණාව ඔබ සමග පවතීවා!

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ වහන්සේ තුළ
ඔබගේ සහෝදර පාස්ටර් එස්. සෑම් සෙල්වරාජ්,

*In Christ Jesus, your servant,*
*Pr. S. Sam Selva Raj,*
E.mail : sam@echoofhiscall.org

*1 පිටුවෙන්....*


**David defeated the Philistines and subdued them**

දාවිත් පිලිස්තිවරුන්ව පරාජය කරමින් ඔවුන්ව යටත් කරගත්තේය. පිලිස්තිවරුන් සමග දාවිත් වසර ගණනාවක්ම ගැටුම් අත් විඳ තිබුණේය. එහෙත් දෙවියන්වහන්සේගේ පරිපූර්ණ කාලය තුළින් සියල්ල වෙනස් විය. අපට ඉතාම දරුණුම දේ සිදුවන විට දෙවියන් වහන්සේගේ පොරොන්දු ඉෂ්ට වීමට පටන් ගත් විට සතුරා පරාජයට පත්වෙයි.

අප 2026 වන වසරට පා තබන විට එක් දෙයක් මතක තබා ගනිමු. දෙවියන් වහන්සේගේ වේලාව කොයි විටෙකවත් ප්‍රමාද වන්නේ නැත. උන්වහන්සේගේ සැලැස්ම අපි නොදැක්කත් අපගේ ජීවිතයේ එය සිදුවෙන්නට යනවා.

## දෙවියන්වහන්සේ ක්‍රියා කරන විට එය අවසානයයි !

*"මින්පසු දාවිත් පිලිස්තිවරුන්ට පහර දී ඔවුන් යටත් කරගෙන, ගාත්ද ඊට අයිති නුවරවල්ද පිලිස්තිවරුන්ගේ අතින් ගත්තේය." (1 ලේකම් 18:1)*

වසර ගණනාවක් පුරාම පිලිස්තිවරු ඊශ්‍රායල්වරුන්ගේ සියලු දේම කොල්ලකෑවෝය. ඊශ්‍රායෙල් සෙනඟට එක විට එක බොහෝ පාඩු සිදුවිය. ඔවුන්ගේ පවුල්, දෙවියන් වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය යන මෙවැනි දේ ඔවුන්ට නැතිවී ගියේය. තවද පූජක වූ ඒලිද ඔහුගේ කාලයේ ඊශ්‍රායෙල් සෙනඟ මහත් වූ පරාජයකට පත් වූ කාලයක්ය කියා සිතුවේය. මේ සියල්ල සිදුවන විට දෙවියන් වහන්සේ නිහඬව සිටියේය.


**The Egyptians you see today, you will never see again**

නමුත් දෙවියන්වහන්සේගේ වේලාවට උන්වහන්සේ මැදිහත් වී උන්වහන්සේ ක්‍රියා කළ විට අවසාන ජයග්‍රහණය සිදුවූයේය. දේව වචනය මෙසේ පවසයි; දාවිත් පිලිස්තිවරුන්ව පරාජයට පත් කළා පමණක් නොව ඔවුන්ව මුළුමනින්ම විනාශ කර දැමුවේය. ඔවුන් ඊට පසුව ඊශ්‍රායෙල් වරුන්ට විරුද්ධව පැමිණුනේ නැත. පිලිස්ත්වරු නිතරම දෙවියන් වහන්සේගේ සෙනඟට විරුද්ධව පැමිණුනත් දෙවියන්වහන්සේගේ බලය කරනකොට ගෙන දාවිත් ඔවුන්ව සම්පූර්ණයෙන්ම විනාශ කර දැමුයේය. මෙය සෑම දේව දරුවෙක්ටම දෙවියන්වහන්සේ දෙන පොරොන්දුවකි. උන්වහන්සේ ඔබගේ සටනට ඇතුල් වන කල්හි ඔබට විරුද්ධව නැගිටි අය කිසිදාක ඔබට විරුද්ධවෙන්නේ නැවත නැගිටින්නේ නැත.

*"..... මක්නිසාද තුමලා අද දවසේ දුටු මිසරවරුන් නැවතත් නවත් කවදාවත් නොදක්නහුය." (නික්මයාම 14:13)*

දෙවියන්වහන්සේගේ බලවත් මහත් කිරීමක්; එනම්; දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ආධිපත්‍යය සහ උන්වහන්සේගේ සෙනඟට නිදහස් කිරීම ගැනීම කතා කරයි.

ඔබ අතර සිටින්නාවූ බොහෝ අයට සතුරා පසුගිය වර්ෂය පුරාම තබා තිබුණේ; ඔබගේ සමාදානය, ඔබගේ සෞඛ්‍යය ආර්ථිකය සම්බන්ධතාවය රැකියාව යන මේ සියල්ලේ දී ඔබ මුහුණ දෙන් අසීරු තත්ත්වයන් දෙවියන් වහන්සේ ඔබට ප්‍රකාශ කරන්නේ 2026 වසරේ සතුරා ඔබගේ සොරා ගත් සියල්ලම නැවත ඔබ ලබාගන්න කියාය.

දාවිත් සතුරාට විරුද්ධව ජයග්‍රාහීකව ජිවිතෙය්ය.මෙම 2026 වන වසරේදි ඔබ සතුරාගේ සියලු පහරදීම් වලින් වැළකී ක්‍රිස්තුස්වහන්සේගේ ආධිපත්‍යයෙන් සතුරාට විරුද්ධව ජයග්‍රහණයෙන් ඇවිදින්නය කියා මා යාච්ඤා කරමි. ඔබගේ අභියෝගය සහ ඔබට මුහුණ දෙන්නා වූ සෑම ඉඩ ප්‍රස්ථාවේදීම පසුගිය වසරේදි පරාජය අත්කර ගෙන තිබුනත් මෙම වසරේදි ජයග්‍රහණය තිබෙන බව විශ්වාස කරන්න.

ඔබට අහිමි වූ සියල්ල මේ වසර තුළ අත්පත් කරගන්න බව සිතන්න.

එසේම මෙම වර්ෂය තුළ ඔබ ළඟ තිබෙන දේ ආරක්ෂා කරගන්නා බව පමණක් නොව ඔබට අහිමි වූ දේ නැවත ලබා ගන්නා වූ වසරක් වේවා.

## ජයග්‍රහණයේ ලකුණක් ලෙස දාවිත් ගාත් අත්පත් කර ගත්තේය.

දාවිත් පිලිස්තිවරුන්ව පරාජයට පත් කරමින් ඔවුන්ගේ ප්‍රධාන නගරය වූ ගාත් අල්ලා ගත්තේය. ගාත් නගරය ගොලියත් නැමැති යෝධයා ජීවත් වූ නුවරයි. එම ස්ථානයේ සිට ඔහු ඊශ්‍රායල් සෙනඟට වද දෙනු ලැබුවේය. *(1 සාමුවෙල් 17:4) (2 සාමුවෙල්21:15-21)* දෙවියන් වහන්සේගේ බලයට විරුද්ධව කිසි කෙනෙක්ට සිට ගැනීමට බැරිය.

වරක් තමා පරාජිතයැයි සිතූ ස්ථානය දාවිත් ජයග්‍රහණය අත්පත් කරගත්තේය. මේ ආකාරයට ඔබගේ ජීවිතයේ ඔබ දුක් වෙන්නා වූ පරාජිතයැයි කියා සිතූ සියලුම අංශවලට දෙවියන් වහන්සේ විසින් ඔබට ජයග්‍රහණය ගෙන දෙනවා ඇත. මන්ද දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පොරොන්දු ඉෂ්ට කරන්නා වූ දෙවියන් වහන්සේය.

## දෙවියන්වහන්සේ දාවිත්ට දයාව පෙන්වනු ලැබුයේ ඇයි ?

දාවිත් සම්පූර්ණ වූ පුද්ගලයෙක් නොවෙයි. ඔහු හැඟීම්බර, දුර්වල, කැඩී බිඳී සිටියාවූ පුද්ගලයෙකි. නමුත් උන්වහන්සේ ඔහුට කතා කරනු ලැබුවේ; *මාගේ සිතට එකඟ වූ මනුෂ්‍යයා' යනුවෙනි. (1 සාමුවෙල් 13:14) (ක්‍රියා 13:22)*

දෙවියන් වහන්සේ ඔහුට මේ ආකාරයෙන් දයාව පෙන්වමින් ඔහුගේ පරම්පරාව ආශිර්වාද කිරීමට සිදු වූ අභිරහස කුමක්ද ?

## 1). දාවිත් දෙවියන් වහන්සේට ප්‍රමුඛස්ථානය දුන්නේය !

දාවිත් නිතරම දෙවියන් වහන්සේව තමා ඉදිරියේ තැබුවේය. ඔහුගේ පරාජිත අවස්ථාවන්වලදී පවා ඔහුගේ පළමුවෙනි වගකීම වූයේ පසුතැවිලි වෙමින් උන්වහන්සේට භාරවීමයි. ඔහු මෙසේ යාච්ඤා කළේය

*''ඔබ ඉදිරියෙන් මා බැහැර නොකළ මැනව; ඔබගේ ශුද්ධාත්මය මාගෙන් පහ නොකළ මැනව." (ගීතාවලිය 51:11)*



*Do not take Your Holy Spirit from me*

....Contd. to page 6





ඉතා හදිසි දැනුම් දීමක්!

අපගේ ලිපිනය:

ECHO OF HIS CALL,
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: [illegible]@echoofhiscall.org

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිදු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

GREAT COMMISSION PARTNERS

ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ජන:19** - අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල නත්තල් සහ අලුත් අවුරුදු සැමරුම් අර්ථවත්ව හා බලපෑමක් සහිතව පැවැත්වීමට කරුණාව ලබාදුන් නිසා ස්තුති කරන්න.

**ජන:20**- අපගේ යාච්ඤා හවුල්කරුවන් දායක හවුල්කරුවන් ඇද්හිල්ලේ හවුල්කරුවන් ජීවිත කාලය පුරා හවුල්කරුවන් මහා නියෝගයේ හවුල්කරුවන් සහ ඔවුන්ගෙන් පවුල් කෙරෙහි උන්වහන්සේගේ අති මහත් දයාව ලබා දී තිබෙන නිසා ස්තුති කරන්න.

**ජන:21** - කරුණ හා ආරක්ෂණ සේවය සඳහා අපගේ ගෝලීය දැක්මට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**ජන:22**- අපගේ මිනිත්තු 5ක පණිවිඩය ළඟා නොවූ අය වෙතට ළඟාවීමට හැකිවන පරිදි අපගේ You tube සේවාවට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**ජන:23** - ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසල, නෙහෙමියා බයිබල් විද්‍යාල සහ හැපෑල් මිෂනරි පාඩම් මාලාව යන සියලුම ක්‍රියාකාරකම් නිසා ස්තුති කරන්න.

**ජන:24**- අපගේ ප්‍රකාශන මුද්‍රණාලය හරහා භාෂා 16කින් නිකුත් කරන සඟරාව හා තවත් බොහෝ මුද්‍රණ කටයුතු කර ගැනීමට හැකිවූ නිසා ස්තුති කරන්න.

**ජන:25**- අපගේ ජ්‍යෙෂ්ඨ දේවගැතිමා විවිධ සේවාවන් හරහා සුභාරංචිය ප්‍රකාශ කිරීමට නොසැලෙන කැපවීමක් ඇති නිසා ස්තුති කරන්න.

**ජන:26**- කැදවීමේ ප්‍රතිරාවයේ කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වලට යහපත් සෞඛ්‍යයක් සහ දිව්‍ය ආරක්ෂාව ලබා දී තිබෙන නිසා ස්තුති කරන්න.

**ජන:27**- ශ්‍රී ලංකා දේශයෙහි සිටින්නා වූ සියලුම මනුෂ්‍යයන් කෙරෙහි දෙවියන් වහන්සේගේ කරුණාව හා දයාව තැබූ නිසා ස්තුති කරන්න

**ජන:28**- ශ්‍රී ලංකා දේශයෙහි සිටින්නාවූ සියලුම දේවදාස දාසින් හා ඔවුන්ගේ පවුල් වලට ලබාදුන් මහත් වූ ආරක්ෂාව හා දිව්‍යමය සැපයීම් නිසා ස්තුති කරන්න

**ජන:29**- ශ්‍රී ලංකා දේශය තුළ සුභාරංචිය ප්‍රකාශ කිරීමට දෙවියන් වහන්සේ බොහෝ මාර්ග සලසා දුන් නිසා ස්තුති කරන්න.

**ජන:30**- ශ්‍රී ලංකා දේශය තුළ තිබෙන්නා වූ සෑම කිතුනු සභාවක්ම බාධා වලින් තොරව පවත්වාගෙන යාමට කරුණාව දී තිබෙන නිසා ස්තුති කරන්න.

**ජන:31** - අප දේශයේ සිටින්නාවූ සියලුම කිතුණුවන්ට සියලු බාධාවන් වලින් ජයගෙන ඉදිරියට යාමට දී තිබෙන කරුණාව නිසා නිසා ස්තුති කරන්න.

**පෙබ:01**- ශ්‍රී ලංකා දේශයට මේ වනවිට යහපත් කාලගුණික තත්ත්වයක් ලබාදී තිබෙන නිසා ස්තුති කරන්න.

**පෙබ:02**- ශ්‍රී ලංකාව තුළ ස්වභාවික ව්‍යසනයට ගොදුරු වූ මනුෂ්‍යයන්ගේ අවශ්‍යතාවයන් සපයා දී තිබෙන නිසා ස්තුති කරන්න.

**පෙබ:03**- අපගේ ප්‍රධාන දේව ගැතිතුමාගේ දේව සේවා ගමන්වලට ආශිර්වාද කළ නිසා 2026 වසර සඳහා ඔහුට ලබා දුන් නව දැක්ම නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**පෙබ:04**- ඊශ්‍රායලය, පලස්තීනය, රුසියාව සහ යුක්රේන අතර සාමය ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:05**- අපගේ ප්‍රධාන දේව ගැති ගරු එස්.සෑම් සෙල්වරාජ් සහ ඔහුගේ පවුලේ අයව සියලුම නපුරු බලවේගයන්ගෙන් ආරක්ෂා කරදෙන පිණිස යාච්ඤා කරන්න

**පෙබ:06**- ලොව පුරා ව්‍යාප්තව තිබෙන සියලුම කිතුණු සංවිධාන සහ සභාවන් කෙරෙහි දෙවියන් වහන්සේගේ ආරක්ෂාව සහ ආශිර්වාදය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:07**- අපගේ කාර්යාලයේ කාර්ය මණ්ඩලය සහ මුද්‍රණාලයේ කාර්ය මණ්ඩලයට යහපත් සෞඛ්‍යයක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:08**- ගෝලීය ආර්ථික අවපාතය අවසන් වන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:09**- ලොව පුරා සිටින්නා වූ මිෂනාරිවරුන්ට සහ දෙවියන්වහන්සේගේ සේවකයින්ට එරෙහිව තිබෙන්නා වූ ප්‍රචණ්ඩත්වය අවසන් වන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:10**- ලොව පුරා සිටින්නා වූ සියලුම කාන්තාවන්ගේ සහ දවන්ගේ ආරක්ෂාව උදෙසා යාච්ඤා කරන්න.

**පෙබ:11**- රාජ්‍ය සහ පෞද්ගලික පාසල්වල විභාගය සඳහා සූදානම් වන සිසුන්ට සාර්ථකත්වය සහ දිව්‍ය මඟපෙන්වීම ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:12**- ශ්‍රී ලංකා දේශය තුළ ඇති වූ ආපදා තත්ත්වය නිසා අවතැන්ව සිටින්නා වූ සියලුම මනුෂ්‍යයන්ට ආරක්ෂාව සහ මූලික අවශ්‍යතාවයන් ඉටුවන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:13**- අවතැන්ව සිටින්නා වූ සියලු මනුෂ්‍යයන්ගේ කැඩී බිඳී තිබෙන මානසිකත්වය නැවත ගොඩනැගෙන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:14** - ලොව පුරා විසිරී සිටින්නාවූ සියලුම මනුෂ්‍යයන් වෙතට සුභාරංචිය රැගෙන යාමට මනුෂ්‍යයන් නැගිටින පිරිසක් ඒ සඳහා අවශ්‍ය සියලුම දේ සපුරා දෙන පිණිසත් යාච්ඤා කරන්න.

**පෙබ:15**- නොයෙකුත් රෝගී තත්ත්වයන්ගෙන් දරිද්‍රතාවයෙන් සහ කුසගින්නෙන් පෙළෙන්නාවූ අයට දෙවියන්වහන්සේගේ සහනය හා උපකාරය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:16** - මත්පැන් සහ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින්නන් සහ නොයෙකුත් වැරදි ක්‍රියාවන්වලින් නිදහස් වීමට නොහැකිව සිටින්නා වූ අයට සැබෑ පසුතැවිලි වීමක් හා පරිවර්තනයක් ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:17**- මෙම මාසය පුරාවටම අපගේ සියලුම අවශ්‍යතා සඳහා ස්වාමීන්වහන්සේගේම්මහත් වූ සැපයීම උදෙසා යාච්ඤා කරන්න.

**පෙබ:18**-- ලොව පුරා විසිරී සිටින්නා වූ සියලුම දරුවන් සහ තරුණ තරුණයින් ජංගම දුරකථන සහ අන්තර්ජාල ක්‍රීඩාවලට ඇබ්බැහි වීමෙන් ආරක්ෂා කර දෙන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

*"දාවිත්දෑ: මම මහත් අමාරුවකට පැමිණ සිටිමි. ඉතින් ස්වාමීන්වහන්සේගේ අතට භාරවන්නෙමු; මක්නිසාද උන්වහන්සේගේ අනුකම්පාව මහත්ය. මනුෂ්‍යයන්ගේ අතට අසු නොවෙමිවායි ගාද්ට කීවේය." (2 සාමුවෙල් 24:14)*

දාවිත් දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයට ප්‍රමුඛස්ථානය දුන්නේය. ඔහුගේ සිංහාසනය, ඔටුන්න යන මේ සෑම දේටම වඩා ඔහු දේව අභිමුඛත්වය ප්‍රිය කළේය. අපගේ සතුරා අපගෙන් සොරකම් කළා වූ සියලූ දේ අප නැවතත් ලබා ගැනීමට නම්; මේ වසරේදී දෙවියන්වහන්සේට ප්‍රමුඛස්ථානය දීමට ඉගෙන ගනිමු. අපගේ යාච්ඤාව විය යුත්තේ :

*"ස්වාමීනි, ඔබ වහන්සේ මාව ස්ථිර කළ මැනව, ඔබගේ මාර්ගය තේරුම් නොහැකි වුවහොත් මට ඔබවහන්සේ මග පෙන්නුව මැනව." (හිතෝපදේශ 3:5-6)*

## 2). දාවිත් රාජ්‍ය මනසක් ඇති කෙනෙක්ය!

දාවිත් දේව මාලිගය සෑදීමට සියලු දේම සූදානම් කර තිබුණත් ඔහුට දෙවියන් වහන්සේගෙන් එය සෑදීමට අවසරය ලැබුණේ නැත. තවද ඔහු ඔහුගේ පුතුවූ සාලමන්ටත් ඔහුගේ පරම්පරාවටත් දේවමාලිගය සෑදීමට අවශ්‍ය සියලුම මුදල් හා වස්තුව රැස්කර තිබුණේය.

ඔහු තමාගේ පුද්ගලික කාරණා ගැන නොසිතා දෙවියන් වහන්සේගේ නාමය මහිමයට පත්කිරීම ගැන සිතමින් ක්‍රියා කළේය.

අද ලෝකේ ජීවත් වන්නා වූ බොහෝ දෙනා තමාගේ නම්බු නාමයත් තමාට අනුගාමිකයන් ලබා ගැනීම පිණිසත් ජනප්‍රියත්වය ලබා ගැනීම පිණිසත් ක්‍රියා ක්‍රියා කරති. නමුත් සැබෑ දේවදාසයන් දේවරාජ්‍යයේ සංකල්පය හා දේව රාජ්‍යය ගැන සිතමින් වැඩ කරන්නෝය. දෙවියන් වහන්සේ අනෙක් අය නොදකින්නාවූ ඔබගේ වෙහෙස මහන්සිය හා ක්‍රියාව දැක උන්වහන්සේ ඔබට ආශිර්වාද කරන්නේය.

ස්වර්ගයෙහි මෙන් මේ පොළොව මත දෙවියන්වහන්සේගේ රාජ්‍යය පැමිණෙන්නට ඕනෑය කියා අප ආශාවෙන් ක්‍රියා කරනවා නම්; සැබවින්ම දෙවියන්වහන්සේගේ දයාව අපට තිබෙන්නේය. අපට තිබෙන්නා වූ ජනප්‍රියකමවත් facebook හා Youtube හරහා අපගේ වැඩසටහන් හා ක්‍රියාකාරකම් අනෙක් අය නරඹනවාද කියා සිතන්නේ නැතුව අප තුළින් යේසුස් වහන්සේව දැක උන්වහන්සේ තුළ ඇවිදිනවාද කියා අප බැලිය යුතුයි.

2026 වන වසරේදී අප ගැන අප නොසිතා දේව රාජ්‍යයේ සංකල්පය තුළින් දෙවියන් වහන්සේ ගැන පමණක් සිතා ක්‍රියා කරමු.

*"කරන්ට නුඹේ අතට සම්බවෙන සියල්ලම නුඹේ වීරයෙන් කරපන්න.........." (දේශනාකාරයා 9:10)* දෙවියන් වහන්සේට මහිමය වේවා.

## (3). දාවිත් සෑම දේ තුළින්ම දෙවියන් වහන්සේව මහිමයට පත් කළේය.

දාවිත් සෑම ජයග්‍රහණයක්ම දෙවියන් වහන්සේ තුළින් පැමිණෙන බව නිතරම එත්තු ගත්තේය.

ඔහු ජයග්‍රහණය ලබාගත් රටවල් වලින් රන්, රිදී සහ පිත්තල යන සියල්ලම දෙවියන් වහන්සේට කැප කළේය. දාවිත් ඔහුගේ සෑම රන් හා අනෙකුත් සියලු දේ දෙවියන් වහන්සේට කියා ඔප්පු කළේය.

*"දාවිත් හදද්එසෙර්ගේ සේවකයන්ට තිබුණු රන් පලිස් රැගෙන යෙරුසලමට ගෙන ආවේය.........දාවිත් රජ යටත් කරගත් සියලු ජාතීන් වන..........." (2 සාමුවෙල් 8:7,11)*

සතුරාගේ ගෞරවය කියා තිබූ සියල්ල ඔහු රැගෙන දෙවියන්වහන්සේට භාරදුන්නේය. තවද දාවිත් දේවමාලිගය සෑදීම සඳහා සියලුම දේවල් සාලමොන්ට බාර දුන් බව දේව වචනය පවසයි.

*"....දාවිත් ගිය ගිය තැනදී ස්වාමීන් වහන්සේ ඔහුට ජය දුන් සේක." (2 සාමුවෙල් 8:6)*

දාවිත් දෙවියන්වහන්සේට කොපමණ දුරට ගරු කළාද ප්‍රමුඛස්ථානය දුන්නාද එපමණ දුරට දෙවියන්වහන්සේ දාවිත්ව උසස් කරනු ලැබුවේය. ඔහුගේ සතුරන් පවා ඔහුට තෑගි භෝග ගෙන ආවෝය.

*"දාවිත් හදදඑසෙර්ගේ මුළු සේනාවට පහර දුන් බව හාමාත්හි රජ වූ තොයි අසා දාවිත් එසේ හදද් එසෙර්ට විරුද්ධව සටන් කොට ඔහුට පහර දුන් නිසා දාවිත්ට ආචාර කරන්ටත් ඔහුට ආශිර්වාද කරන්ටත් ඔහු වෙතට තමාගේ පුත්‍ර වූ යෝරාම්*

*එව්වේය. මක්නිසාද හදද් එසෙර් සහ තොයි අතරේ යුද්ධ පැවතුණේය. යෝරාම් රිදීබඩු ද රන්බඩු ද පිත්තල බඩු ද ගෙනාවේය. දාවිත් රජ යටත් කරගත් සියලු ජාතීන් වන..." (2 සාමුවෙල් 8:9-11)*



***King David dedicated the gold, silver and bronze to the Lord***

දාවිත් ඔහුට ලැබුණු සියල්ල දෙවියන් වහන්සේට කැප කළේය. ප්‍රිය සහෝදර සහෝදරිය, මේ වර්ෂයේදී අපත් සෑම දේම දෙවියන් වහන්සේට කැප කරමු. එනම්; සෑම ජයග්‍රහණයක්ම, අපට ලැබෙන සෑම අවස්ථාවකටම හා සෑම ආශිර්වාදයක්ම ස්වාමීන් වහන්සේගේය. අප එය උන්වහන්සේටම බාර දෙමු.

*''සෑම යහපත් දීමද සෑම සම්පූර්ණ දීමනාව ද කිසි වෙනස්වීමක්වත් හැරීමේ ඡායාවක්වත් නැත්තාවූ ආලෝකවල පියාණන්වහන්සේ කෙරෙන් ඉහළින් බැස එන්නේය." (යාකොබ් 1:17)*

දෙවියන් වහන්සේ අපට දුන්නා වූ මහත් දීමනා වන ස්වාමී වූ යේසුස්ක්‍රිස්තුස් වහන්සේව අපි අමතක නොකරමු.

අප විශ්වාසයෙන් යුක්තව නැගී සිටින පිණිස උන්වහන්සේ අපගේ වේදනාවන් දරා ගත් සේක.

උන්වහන්සේ අපගේ පාපයත් ශාපයත් තුළින් අපට නිදහස දෙමින් හා අපට ආශිර්වාද කරමින් අපගේ ජීවිතය මුළුමනින්ම වෙනස් කළේය.

## මෙම නව වසර ඔබට ජයග්‍රාහිකව අහිමි වූ සෑම දේම ලැබෙන්නා වූ වසරක් වේවා!

ප්‍රේමවන්තයෙනි, 2026 වන වසර ඔබට තිබෙන දේවල් දැක ගන්න වසරක් පමණක් නොවන්නේය.

සතුරා ඔබගෙන් සොරා ගත් සියල්ල නැවත අත්පත් කරගන්නා වූ වසරක්ය.

ඔබට ලැබුණා වූ ස්ථානය ඔබ නැවත ලබාගෙන ප්‍රීතියෙන් යුතුව කැඩුනාවූ බිඳුනා වූ ඔබගේ ජීවිතය නැවත ලබා ලබාගන්නාවූ වසරක් වීමට,

### දාවිත් මෙන් ඔබත් ;

දෙවියන්වහන්සේට ප්‍රමුඛස්ථානය දෙන්න.
දේව රාජ්‍යයේ මානසිකත්වය තුළ ජීවත් වෙන්න.
ඔබ ළඟ තිබෙන සෑම
දේ තුළින්ම දෙවියන් වහන්සේට ගරු කරන්න.

එවිට ඔබ දෙවියන්වහන්සේගේ අනුග්‍රහයත් ජයග්‍රහණයත් ඔබගේ ජීවිතයේ සෑම අවස්ථාවේදීම අත්දකිනු ඇත. දාවිත් ගිය ගිය සෑම ස්ථානයෙහිදීම දෙවියන්වහන්සේ ඔහුට ජයග්‍රහණය ගෙන දුන්නේය.



***You will see God's supernatural favour and victory in every area of your life.***

*''......දාවිත් ගිය ගිය තැනදී ස්වාමීන් වහන්සේ ඔහුට ජය දුන් සේක" (2 සාමුවෙල් 8:6)*

2026 වන වසරේදී මෙය ඔබගේ සාක්ෂියක් වේවා! ඔබ යන්නා වූ සෑම ස්ථානයේදීම දෙවියන්වහන්සේ ඔබට ජයග්‍රහණය දෙමින් ඔබ සමඟ සිටින සේක. ....Contd. to page 10

NEHEMIAH BIBLE COLLEGES,
Qualification : 10th Standard & above
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Rush for admission! Medium :Tamil (Part Time)
Hindi (Residential) (Sponsorship Available)
Diploma in Theology
Recognised by International Christian Leaders & Senior Pastors for the past 56 years
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

"...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

## ස්වාමීන්වහන්සේ මගේ ජීවිතයේ මගපෙන්වීමත් හා සැපයීමත්ය !

*"උන්වහන්සේ තමන් කෙරෙහි භය ඇත්තන්ගේ ආශාව ඉෂ්ටකරදෙන සේක;........." (ගීතාවලිය 145:19)*

1982 වන වසරේදී ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ මහත් වූ කරුණාවෙන් චෙන්නෙයි නගරයේ චේපාක් යන ප්‍රදේශයේ සභාවක් ආරම්භ කිරීමට මා හට උපකාර කළේය. නමුත් සෑම අවස්ථාවේදීම අපට ස්ථිර ස්ථානයක් නොමැතිකම නිසා විටින් විට ස්ථාන මාරු කිරීමට සිදුවිය. මන්ද මෙම ප්‍රදේශය කිතුනුවන්ට විරුද්ධව ක්‍රියා කළා වූ ප්‍රදේශයක්ය.

අවසානයේදී අපට ඉරුදින දේව මෙහෙය පැවැත්වීමට කුඩා ශාලාවක් ලැබුණ නමුත් එහි බොහෝ පහසුකම් නොතිබුණේය.මෙම නිවස සහෝදර ජෝර්ජ් ට අයිතිව තිබුණේය.

දිනක් මේ අපහසුතා මධ්‍යයේ දී අප ට දේව මෙහෙය පවත්වන අවස්ථාවේදී එම පළාතෙහිම විශාල ගොඩනැගිල්ලක් සෑදීමට යන්නේය කියා මගේ හදවතට මහත් වූ බරක් ඇති කළේය. මම ඒ සභාවේ සෙනගට එය පවසා යාච්ඤා කළෙමි.

නමුත් බොහෝ දෙනෙක් මගේ යෝජනාවට කැමැත්ත ප්‍රකාශ කළේ නැතත් සමහරු මට විහිළු කළේය.

තව සමහරු අපගේ ආර්ථික තත්ත්වය අඩු නිසා මෙම ස්ථානයේ ඉඩමක් ගැනීම අසීරු බව පැවසුවේය.

තවත් සමහරු අපට මුදල් තිබුනත් මෙම පළාතෙහි ඉඩමක් මිලදී ගැනීමට බැරි බව ප්‍රකාශ කළේය.

තවත් අය දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයෙක් හැටියට මෙවැනි අසාමාන්‍ය දේ පැවසීම නුසුදුසුය කියා පවසනු ලැබීය. මෙවැනි සියලු කතා නිසා මා කැළඹීමට හා අධෛර්යයට පත් වූ වෙමි.

එක්කෙනෙක්වත් මා සමග සිට ගත්තේවත් ඇදහිල්ලෙන් පියවරක් තැබීමට මා සමග පැමිණුනේවත් නැත.

පොදුවේ සියලු දෙනාම සිතුවේ කිතුණු දේශකයන් කතා කරන්නන් පමණක් බවත් සැබෑලෙස ක්‍රියා නොකරන බවයි. නමුත් මෙලෙස කතා කළ සියළු දෙනා දෙවියන් වහන්සේගේ දර්ශනය තේරුම් ගත්තේ නැත.

මා මෙවැනි කැලඹුණු තත්ත්වයක සිටියදී දෙවියන් වහන්සේ මාව සනසනු ලැබුවේය. උන්වහන්සේ ඇදහිල්ලේ කතෘ කතෘවරයානෝය. (හෙබ්‍රෙව් 12:1) කියා මාව ශක්තිමත් කරනු ලැබුවේ ය. තවද දේව වචනයෙන් උන්වහන්සේ මට මෙසේ කතා කරනු ලැබුවේය;

*"පණුවෙක් වැනි වූ යාකොබ් නුඹද ඊශ්‍රායල් මනුෂ්‍යයෙනි නුඹලාද බිය නොවෙල්ලා; මම නුඹට පිහිටවන්නෙමි ස්වාමීන් වහන්සේ කියන සේක. නුඹේ මිදුම්කාරයාණෝ ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනන් වහන්සේය. බලව, මම නුඹ මුවහත් වූ අලුත් දැති ඇත්තා වූ මඩින යන්ත්‍රයක් කරන්නෙමි. නුඹ කඳු මැඩ පොඩිකර, හෙල් බොල් මෙන් කරන්නෙහිය." (යෙසායා 41:14-15)*

දින ගණනක් ගත වූ විට මට විරුද්ධව කතා කළ සෑම දෙනා ඉදිරියේ දෙවියන් වහන්සේ මට ඉතා හොඳ ස්ථානයක් දී උන්වහන්සේ දුන් දර්ශනය ඉෂ්ට කරමින් මාව ගෞරවයට පත් කළේය.

දැන් අපට ස්ථානයක් ලැබුණු නමුත් එය ලබා ගැනීමට මා අත මුදල් තිබුණේ නැත. මෙම මුදල ලබා ගැනීම පිණිස මා විවිධ ස්ථානවලින් උදව් උපකාර පැතූ නමුත් මා ආර්ථික අතින් දිළිඳු නිසා කිසිවෙක් මට මුදල් ලබාදීමට ඉදිරිපත් වූයේ නැත. මා මෙවැනි බලාපොරොත්තු රහිත වූ තත්ත්වයක් තුළ සිටි අතර එවකට මා රාජ්‍ය සේවයේ යෙදී සිටි බැවින් දේපළ මිලදී ගැනීම පිණිස රජය විසින් මා හට පුද්ගලික ගොඩනැගිල්ලක් ගැනීමට අත්තිකාර මුදලක් ලබා දෙනෙන ලදී. මෙම අවස්ථාවේදී කිතුණු නොවන්න සහෝදරයෙක් වූ කන්නන් සහ කිතුනු සහෝදරයෙක් වන ජේය කුමාර්ව දෙවියන් වහන්සේ මෙම කාර්ය උදෙසා පාවිච්චි කළේය.

ක්‍රිස්තුස්වහන්සේ සෑම විටම විශ්වාසවන්තයි. උන්වහන්සේ සෑම විටම යහපත්ය. අප සේවය කරන්නා වූ දෙවියන් වහන්සේ අනර්ඝයි. *"ස්වාමීන් යහපත් බව රස බලා දැනගනිව්......." (ගීතාවලිය 34:8)*

අද මා මෙම ලිපිය ලියන අවස්ථාවේදී පවා මගේ ජීවිතයේ බොහෝ අභියෝගයන් වලට මුහුණ දෙමින් සිටිමි. සෑමදාම බොහෝ අමාරුකම්වලට මා මුහුණ දෙමි. දෙවියන් වහන්සේ මට දුන් මේ සේවයේදී බොහෝ අභියෝග මා ඉදිරියේ තිබේ. කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව සෑම මසකම භාෂා 16කින් නිකුත්කිරීමටත් තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව භාෂා තුනකින් පැවැත්වීමටත් නෙහෙමියා බයිබල් විද්‍යාලත් ප්‍රධාන සභාවත් ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලත් මුද්‍රණාලයත් තවත් පරිපාලන කටයුතු වැනි බොහෝ අභියෝග මා ඉදිරියෙහි තිබෙන අතර පුද්ගලික ලෙසද මා බොහෝ අභියෝග වලට මුහුණදෙමි.

## MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines :English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikaans.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Theological Correspondence Courses: English & Tamil
5. Nehemiah Bible Colleges (Chepauk, Santhoshapuram & Velachery)
6. Branch Churches: Santhoshapuram, Balaji Nagar & Velachery
7. Great Commission Partners (Network of Pastors)
8. Training Programmes – Seminars & Retreats
9. Crusades
10. Literature Distribution and Follow Up
11. Gospel Printing Press - Publications
12. St. Paul's Matriculation School - Village English High School
13. Sunday Schools (Chepauk) : 10.30 a.m. Sunday & (Velachery, Balaji Nagar & Santhoshapuram) 3.00 p.m. Sunday
14. **Early Morning Service : 5.30 a.m. Sunday**
15. **Preliminary Service : 8.00 a.m. Sunday**
16. **Tamil Service : 8.30 a.m. Sunday**
17. **Youth Meeting : 11.00 a.m. Sunday**
18. **Fellowship Lunch : 1.00 p.m. Sunday**
19. **Telugu Service : 4.00 p.m. Sunday**
20. **Hindi Service : 5.00 p.m. Sunday**
21. **Tamil & English Service : 6.00 p.m. Sunday**
22. Feedback Time : 7.30 p.m. Sunday
23. Women's Prayer : 5.30 p.m. Wednesday
24. Hindi Prayer : 7.00 p.m. Wednesday
25. Men's Prayer : 7.30 p.m. Friday
26. Discipleship Meeting : 6.00 p.m. Saturday
27. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
28. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
29. Ministers' Meeting : 5.30 p.m. First Saturday
30. Parents' Prayer : 4.00 p.m. First Sunday
31. Night Prayer : 9.30 p.m. Third Friday
32. Fasting Prayer : 9:30 a.m. Second Saturday
33. Holy Communion : Second Sunday Service
34. Youth / Kid Prayer : 10.00 p.m. daily (over phone)
35. Staff Devotion : 9.00 a.m. daily
36. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

මෙවැනි වූ බොහෝ අමාරුකම් ගැන සිතන නිසා බොහෝ රාත්‍රීන් මට නින්දක් නොමැත. මේ සෑම දේ තුළදී යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පමණක් විශ්වාසවන්තයි. සෑම නපුරු අවස්ථාවන්වලදී උන්වහන්සේගේ මග පෙන්වීම හා සැපයීම මා අත් දුටුවෙමි.

අලංකාර ගීතයක මෙසේ සඳහන් කර තිබේ ;
රාත්‍රිය ඝණ අඳුරුයි, මා නිවසින් බොහෝ දුරයි, මාව ඉදිරියට ගෙනයන්න!
කරුණාවෙන් මට මග පෙන්වා, ආලෝකය දෙන්න, මා වට කර
ඇති අන්ධකාරය මැද මා ඉදිරියට ගෙනයන්න!
මගේ පාදය රැකගෙන මට මග පෙන්වන්න, මන්ද දුර ඈත මට නොපෙනෙයි!
නමුත් සෑම මොහොතකම එක පියවරක් තැබීමට මට උපකාර කරන!
මගේ ජීවිතය තුළ කොපමණ අමාරුකම් තිබුණත් දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම
ගැන මා අධිකව විශ්වාස කරමි. මේ ලෝකයේ දී උන්වහන්සේගේ කාරණාවන් අවසන් කළ විටදී
මා ස්වර්ග රාජ්‍යයට ඇතුළු වී ස්වාමින්වහන්සේව මුණ ගැසෙන්නට ඉතා ආශාවෙන් බලා සිටිමි.
ඒ දවස මට මහත් ප්‍රීතිමත් දවසක් වන්නේය. ස්වාමින්වහන්සේව මුණගැසී උන්වහන්සේව මුහුණෙන්
මුහුණට දැකීමෙන් හා උන්වහන්සේ සමග වාසය කිරීමේ දවස ආශිර්වාදයක් වෙයි.

*මගේ බලාපොරොත්තුව නම් මෙයයි. ඔබටත් මෙවැනි බලාපොරොත්තුවක් තිබේද?*



*************

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

*....Contd. from page 7*



***The Lord gave David victory wherever he went***

පරාජයට පත් වුණා වූ බිය ඇති වූ සෑම ස්ථානයේදීම ඔබ සැබැවින්ම ඇදගිල්ලේ වීරයෙක් වෙන්නේ කියා ප්‍රාර්ථනා කරන්නෙමු!




දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක! ඔබට ඉතාම ජයග්‍රාහී වසරක් වේවා!

*************

**NOTICE**

Save our mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (main numbers) in your mobile phones. - Editor

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

Annual Subscription : Rs. 100/- Life Subscription : Rs. 2000/-

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

ECHO OF HIS CALL

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA

PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in

Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**

**Date of Publication: First week of every month**

**Date of Posting : 1st & 2nd of every month**

**Posted at "Egmore RMS Patrika Channel"**

**on 2nd JANUARY 2026.**

**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**

**P.O. Box No. 2957,**

**Chepauk, Chennai - 600 005, INDIA.**

**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**